ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

මැනුම් ක්ෂේත්‍ර සහයකවරුන් II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2022 - නොවැම්බර්

ලිඛිත පරීක්ෂණය

2022.11.12 කාලය : පැය දෙක (02) යි පැය 0930 - 1130

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1.

i) මැනුම් ක්ෂෙත්‍ර සහායක පත්වීමක් ලබා දීමේදී පත්වීම් බලධරයා ලෙස කටයුතු කරන්නේ කවුද?

ii) මැනුම් ක්ෂෙත්‍ර සහායක තනතුරක් ස්ථීර කිරීමේදී ඉදිරිපත් කල යුතු ලේඛන 04 ක් නම් කරන්න

iii) වැටුප් වැඩිවීම ලබා දීමේදී ඉදිරිපත් කරන වාර්තාව කුමක්ද?

iv) රාජ්‍ය සේවයේ තනතුරකට බඳවා ගැනීමේදී පරිවාස කාලය ලෙස හඳුන්වන්නේ කුමක්ද? එම කාලය කොපමණද?

(ලකුණු 10)

2.

i) අතිකාල දීමනාව යනු කුමක්ද?

ii) අතිකාල දීමනාවට හිමිකම් නොමැති නිලධාරීන් කවරහුද?

iii) විදේශ නිවාඩු සඳහා ලබා ගත හැකි උපරිම නිවාඩු ප්‍රමාණය කොපමණද?

iv) රාජ්‍ය සේවකයෙකුට ලබා ගත හැකි නිවාඩු වර්ග 04 ක් නම් කරන්න.

(ලකුණු 10)

3.

i) ඉඩම් මැනුම් කටයුතු වලදී භාවිතා වන අණ පනත් 03 ක් නම් කරන්න

ii) මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් පිළියෙල කරනු ලබන පිඹුරු වර්ග 04ක් නම් කරන්න.

(ලකුණු 10)

4.

ඉංජිනේරු මැනුමක් සිදුකර සමොච්ඡ රේඛා සිතියමක් සකස් කිරීමට මැනුම් ඉල්ලීමක් ලැබී ඇති බව මිනින්දෝරු මහතාගෙන් ඔබට දැනගන්නට ලැබින.

i) සාමාන්‍ය මැනුමක හා ඉංජිනේරු මැනුමක ප්‍රධාන වෙනස් කම කුමක්ද?

ii) ඉංජිනේරු මැනුම සඳහා භාවිතා කරන සාමාන්‍ය උපකරණ 03ක් නම් කරන්න.

iii) එම උපකරණ භාවිතා කර ලබා ගන්නා තොරතුරු මොනවාද?

iv) මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් සිදු කරන වෙනත් මැනුම් වර්ග 02 ක් ලියා දක්වන්න.

(ලකුණු 10)

5.

භූමිතික මැනුම් පාලන ලක්ෂ්‍යය පිහිටුවීමකදී සැලකිලිමත් විය යුතු කරුණු 5 ක් දක්වන්න.

(ලකුණු 10)

6.

i) කාර්යාලයකින් තොරතුරු ලබා ගැනීම සඳහා හඳුන්වාදුන් පනත කුමක්ද?

ii) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයක තොරතුරු ලබා ගැනීම සඳහා පත්කර ඇති තොරතුරු නිලධාරියා කවුද?

iii) කාර්යාලයක පහත ආකෘති පත්‍ර භාවිතා කිරීමේ අවස්ථා නම් කරන්න.

(අ) පොදු 125

(ආ) පොදු 177

(ඇ) පොදු 35(අ)

(ලකුණු 10)

7.

i) මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන සිතියම් වර්ග 02ක් නම් කරන්න

ii) පිඹුරක දැකිය හැකි ලක්ෂණ 04 ක් නම් කරන්න.

iii) ඉඩම් විස්තර ලැයිස්තුවක ඇතුලත් තොරතුරු වර්ග 04 ක් නම් කරන්න.

(ලකුණු 10)

8.

කෙටි සටහන් ලියන්න.

i. පිල් ලකුණ
ii. දුම්රිය බලපත්‍ර
iii. අනියම් සහ විවේක නිවාඩු
iv. පිහිටි මායිම් ගල

(ලකුණු 10)

සටහන : සපයා දී තිබෙන ක්ෂේත්‍ර පත්‍රය භාවිතා කර 9 හා 10 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

9.

i) මෙම ක්ෂේත්‍ර පත්‍රයේ (i) ග (ii) ලිකු (iii) සිකු යන්නෙන් දක්වා ඇත්තේ මොනවාද?

ii) මෙම මැනුම සඳහා භාවිතා කර ඇති උපකරණ 03 ක් නම් කරන්න.

iii) එම උපකරණ වලින් මෙම මැනුමේදී ලබා ගන්නා තොරතුරු මොනවාද?

iv) මෙම මැනුම මඟින් මැනුම් කර තිබෙන ඉඩම් කැබලි ගණන කීයද?

(ලකුණු 10)

10.

මෙම ක්ෂේත්‍ර පත්‍රයේ ඇති පැරණි මායිම් ගල ක්ෂේත්‍රයේ සොයා ගන්නා ලෙස රජයේ මිනින්දෝරු මහතා ඔබ වෙත දන්වා ඇත. ඔබ ක්ෂේත්‍රයේදී මෙම මායිම් ගල නැවත විවෘත කරන ආකාරය එම ක්ෂේත්‍ර පත්‍රයේ තොරතුරු භාවිතා කර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

